**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**3 සතිය**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 7.2.3. දෙගල්දොරුව රජ මහා විහාරය |

**<u>ඉගෙනුම් ආධාරක</u>**

- කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1747 - 1782) විසින් නිර්මානය කර ඇත.
- දෙවරගම්පල සිල්වත්තැන මෙහි සිතුවම් ඇඳ ඇති අතර, කොස්වත්තේ සිත්තර නයිදේ හා නීලගම පටබැන්දා මොහුට සහාය වී ඇති බව පොත පතෙහි සඳහන් වේ.
- ගර්භගෘහයට ඇතුළුවන දොරටුව දෙපස ඇති තීරු චිත්‍ර සංරචන අතර වෙස්සන්තර ජාතකය හා සුතසෝම ජාතකය සුවිශේෂී නිර්මාණ වශයෙන් දක්වේ. විශේෂයෙන් වෙස්සන්තර ජාතක කතාව තුළ ගැබ්ව ඇති ඇලි ඇතු දන්දීම දක්වෙන චිත්‍රය විශිෂ්ට නිර්මාණයකි.
- අඛණ්ඩ කථන ක්‍රමය හා පාර්ශව දර්ශී රූප, ද්විමාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය හා පසුබිම සඳහා අඳුරු රතු වර්ණය භාවිතය, වර්ණ සඳහා කහ, කොළ, රතු, කළු, සුදු ආදී වර්ණ භාවිතය, ෆ්‍රෙස්කෝ සිකෝ හෙවත් වියළි බදාම මත සිතුවම් ඇඳීමේ ශිල්ප ක්‍රමය, පරිමාණය හා පර්යාලෝක රීතීන් නොසැලකීම සිතුවම් නිර්මාණ ආශ්‍රිත දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ වේ.
- විහාර වියන් තලයේ විශාල චිත්‍ර සංරචනයක් ලෙස මාර පරාජය සිතුවම නිර්මාණය කර ඇත.


දෙගල්දොරුව රජ මහා විහාරය


වෙස්සන්තර රජු අලි ඇතුන් දන් දීම


මාර පරාජය

**<u>ඇගයීම</u>**

හිස්තැන් පුරවන්න

1) දෙගල්දොරුව රජ මහා විහාරය ....................................... විසින් නිර්මාණය කර ඇත.

2) විශාල චිත්‍ර සංරචනයක් ලෙස ................................... සිතුවම විහාර වියන් තලයේ දක්නට ඇත.

3) මෙම විහාරය ........................................ විහාර වර්ගයට අයත් වේ.

4) ගර්භගෘහයට ඇතුළුවන දොරටුව දෙපස ඇති තීරු චිත්‍ර සංරචන අතර ............................... සිතුවම හා .............................. සිතුවම දක්නට ඇත.

5) මෙම විහාරයේ දක්නට ලැබෙන සුවිශේෂී සිතුවම් නම් කරමින් ඒවා පිළිබඳ ඇගයීමක් කරන්න